ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව |
| දිනය | **2015 දෙසැම්බර් මස 21 වැනි දින** |

## කොළඹ මහා නගර සභාවේ 150 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් සමරු කාසියක් නිකුත් කිරීම

**කොළඹ මහා නගර සභාව, රට වෙනුවෙන් කරන ලද සේවාව ඇගයීම සහ එහි 150 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුහුණත වටිනාකම රු. 500 ක් වන විශේෂ රිදී සමරු කාසියක් නිකුත් කරන ලදී.**

**<u>කාසියේ මුහුණත</u>**




**<u>කාසියේ පිටුපස</u>**




**මෙම සමරු කාසිය** 2015 **දෙසැම්බර් 14 දින කොළඹ මහා නගර පරිශ්‍රයේදී පැවති උත්සවයේදී ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා විසින් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමා වෙත නිල වශයෙන් පිළිගන්වනු ලැබීය.**

**කාසියේ මුහුණතෙහි කොළඹ මහා නගර සභාවේ 150 වන සංවත්සරය සඳහා වූ ලාංඡනයේ දැක්වෙන රූපය සමඟ "1865" සහ** "2015" **යන වර්ෂයන් දෙපස දැක්වේ. "සහජීවනයේ අසිරිය" සහ "150 සංවත්සරය" යන**

වචන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් එම රූපයට පහළින් දැක්වෙන අතර “කොළඹ මහා නගර සභාව” යන වචන ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා වලින් කාසියේ පරිධියේ දැක්වේ.

කාසියේ පිටුපසෙහි එහි මුහුණත වටිනාකම වන “500” විශාල ඉලක්කම් වලින් සහ “රුපියල් පන්සියයයි” යන වචන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් කාසියේ පරිධියේ දැක්වේ.

මෙම කාසි සීමිත ප්‍රමාණයක් පමණක් විකිණීම සඳහා පවතින අතර රු. 8,110/- ක ස්ථාවර මිලකට කොළඹ 07, පුරහල ස්ථානයේ පිහිටි කොළඹ මහා නගර සභාව වෙතින් මිලදී ගත හැකිය.

වැඩි විස්තර සඳහා;

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව | : දුරකථන අංකය | : 0114387405/ 0112477354 |
| | විද්‍යුත් තැපැල | : currency@cbsl.lk |
| කොළඹ මහ නගර සභාව | : දුරකථන අංකය | : 0112681198 |
| | විද්‍යුත් තැපැල | : munici@slt.lk |

අධිකාරී
ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 1
ශ්‍රී ලංකාව